සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2010(2011)

## (02) රචනය හා සාරාංශය

පැය දෙකයි

ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

---

1. පහත සඳහන් මාතෘකා අතුරෙන් **එකක්** තෝරා ගෙන විශ්ලේෂණාත්මකව හා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් වචන සංඛ්‍යාව **250 - 300 අතර වන සේ** රචනාවක් ලියන්න.

   (i) ජාත්‍යන්තර බලඅරගල විසඳීමේ දී හා ගැටුම් නිරාකරණයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය සතු කාර්යභාරය හා වගකීම

   (ii) බලශක්ති හා තාක්ෂණික මෙවලම් භාවිතය ලොව පුරා ව්‍යාප්ත වීම නිසා මනුෂ්‍ය වර්ගයාට සැලසෙන යහපත හා අයහපත

   (iii) ජාතික අනන්‍යතාව හා සංස්කෘතික උරුමයන්හි චිරස්ථිතිය උදෙසා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය මගින් ලැබෙන දායකත්වය

   (iv) නිරෝගිමත් ජීවිතයක යහ පැවැත්ම සඳහා කායික මෙන්ම මානසික පෝෂණය කෙරෙහි ද සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය වේ.

   (v) ලෝකයේ විවිධ ආගම් අතර සහජීවනය ගොඩනැංවිය යුතු වන්නේ ඒවායේ මූලික හර පද්ධතියට හෝ අනන්‍යතාවට හෝ හානියක් නොවන අයුරිනි.

   (vi) පුද්ගලාන්තර සම්බන්ධතා පැවැත්වීම උදෙසා අත්‍යවශ්‍ය හා පහසු උපකරණයක් ලෙස සැලකෙන ජංගම දුරකථන භාවිතයේ පවත්නා ප්‍රයෝජන හා අප්‍රයෝජන

2. පහත දැක්වෙන ඡේදය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ** වන සේ සාරාංශ කොට ලියා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. (සාරාංශය අවසානයේ ඔබ යෙදූ වචන ගණන ද ලියන්න.)

දීර්ඝ කාලයක සිට ව්‍යාපාර ගනුදෙනු සඳහා ප්‍රතිෂ්ඨාපිත නීතිමය මූලධර්මය වනුයේ 'කැවියට් එම්ප්ටෝර්' (caveat emptor) හෙවත් ගනුදෙනුව සම්බන්ධයෙන් 'ගැනුම්කරු ප්‍රවේශම් විය යුතුය' යන්නයි. මෙම මූලධර්මය මගින් සරලව පැහැදිලි කෙරෙනුයේ, ගනුදෙනුවකට අදාළ ගැනුම්කරුවන් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ඔවුන් විසින්ම ගත යුතු බවත්, ගැනුම්කරුවන්ට සිදුවන අලාභ සම්බන්ධයෙන් විකුණුම්කරුවන්ට වගකීමක් නොමැති බවත්ය. මෙම මූලධර්මය, ඉදිරි රැකුම් උපකරණ සඳහා අදාළ කර ගැනීමේ දී, ගැනුම්කරුවන් ඉදිරි රැකුම් උපකරණ සම්බන්ධව පවතින අවදානම් පිළිබඳව පූර්ණ අවබෝධයකින් යුතුව ගනුදෙනුවට පිවිසිය යුතු වේ. විකුණුම්කරුවන් හිතාමතා හා සිතාමතාම අලාභ ලැබිය හැකි භාණ්ඩ භාර ගැනීම සඳහා ගැනුම්කරුවන් මුලාවට පත් කරන අවස්ථාවන්හි පවා මෙම මූලධර්මය එලෙසම ක්‍රියාත්මක වේ. කෙසේ නමුත්, ව්‍යුත්පන්න උපකරණ ගනුදෙනුවලට සම්බන්ධ ගැනුම්කරුවන් දිගින් දිගටම සැලකිය යුතු අලාභ ලැබීම සම්බන්ධ නඩු පැවරීමේ සිද්ධීන් රාශියක් හේතුකොට ගෙන ව්‍යුත්පන්න උපකරණ සම්බන්ධයෙන් වූ මෙම නීතිමය මූලධර්ම භාවිතය, අධිකරණය මගින් අත්හිටුවන ලදී. මෙයට හේතුවූයේ ඉදිරි රැකුම් උපකරණ නිකුත් කරනු ලබන්නන්, එනම් ප්‍රධාන වශයෙන්ම ආයෝජන බැංකු, ගැනුම්කරුවන්ට අවාසි වන පරිදි මෙම ඉදිරි රැකුම් උපකරණ 'වැරදි ලෙස විකිණීම' (mis-selling) හෝ 'වැරදි ලෙස නම් කිරීම' (mis-labelling) ය.

වර්තමානය වන විට ව්‍යුත්පන්න උපකරණ ගනුදෙනු සඳහා පිළිගත් මූලධර්මය වනුයේ කැවියට් එම්ප්ටෝර් නොව 'යෝග්‍යතාව' (suitability) යන්නයි. යෝග්‍යතාව යන මූලධර්මය මගින්, ගැනුම්කරුවකු සමග ගිවිසුම්ගතවීමට එළඹීමට පෙර, ගනුදෙනුව සඳහා ගැනුම්කරුගේ සුදුසුකම් විනිශ්චය කිරීමේ වගකීම විකුණුම්කරු වෙත පැවරේ. බොහොමයක් මූල්‍ය උපකරණ හා ව්‍යුත්පන්න උපකරණ ද්විත්වභාවයෙන්ම සංකීර්ණ බැවින්, මෙවැනි මූල්‍ය උපකරණ ලබා ගැනීමේ දී, සියලුම ගැනුම්කරුවෝ එහි අවදානම් පිළිබඳව ප්‍රමාණවත් පරිදි තක්සේරු කිරීමක් සිදු නොකරති. එමෙන්ම, එවැනි ව්‍යුත්පන්න උපකරණ ඉහළ වටිනාකමකින් යුක්ත බැවින් ඒ මගින් ගැනුම්කරුවන්ට සැලකිය යුතු අලාභයක් ලැබීමට ද සිදුවේ. එම නිසා ගැනුම්කරුවකු ගනුදෙනුවකට සම්බන්ධ කර ගැනීම සඳහා යෝග්‍ය පුද්ගලයකු බවට පත්කිරීම විකුණුම්කරුගේ වගකීම වේ. වෙනත් වචනවලින් කිවහොත් ව්‍යුත්පන්න ගනුදෙනුවකට අදාළ දෙපාර්ශ්වයම මනා ලෙස එම ගනුදෙනුවෙහි අවදානම් පිළිබඳව දැනුවත්ව සිටිය යුතු අතර ගනුදෙනුවට සම්බන්ධ විය යුත්තේ දැනුවත් පාර්ශ්වකරුවන් වශයෙනි. අදාළ මට්ටම දක්වා ගැනුම්කරු දැනුවත් කිරීම විකුණුම්කරුගේ වගකීම වේ. එබැවින් යෝග්‍යතාව පිළිබඳ මූලධර්මය මගින් ගැනුම්කරුවන්ගේ නොදැනුවත්කමින් විකුණුම්කරුවන් අයුතු ලෙස ලාභ ලැබීමට ඇති හැකියාව ඉවත් වේ.

❋ ❋ ❋

EXAMMOOD.LK